# 01 බස් නැවතුම්පොළක දී



"කළුතරට ටිකට් ගත්ත අය බහින්න"
"එන්න, එන්න"
"කොළඹට යන අය එන්න"
"පානදුර, මොරටුව, කටුබැද්ද, රත්මලාන, ගල්කිස්ස, දෙහිවල, වැල්ලවත්ත, බම්බලපිටිය, කොල්ලුපිටිය, කොටුව, පිටකොටුව."
"අන්න, අන්න, කොළඹට යන බස් එකක් නවත්තලා ඒකෙ සෙනගත් අඩුයි. යමු. යමු."
"යන අය නගින්න. නගින්න"
"ඔය ලොකු පාර්සල් එහෙම අරගෙන නගින්න එපා. ඒවා තියන්න ඉඩ නෑ"
"අතර මගට එහෙම නගින්න එපා."
"වාඩිවෙන්න ඉඩ තියෙනව ද?"
"ඔව්, ඔව්, ඉඩ තියෙනවා."
"ආ, ඔය අම්මා කොහාට ද යන්නෙ?"
"මම රත්මලානට."
"එහෙනම් ඔය අම්මා පස්සට යන්න."
"මේ අක්කාටත් ඇතුළට යන්න ඉඩ දෙන්න."
"ඔය බිම තියෙන පාර්සල් අතට ගන්න."

"පානදුරෙන් එහා යන අය නගින්න. පානදුරෙන් මෙහා නගින්න එපා"

"පානදුරේට ගන්නව ද?"

"ඔව්, ඔව්, නගින්න. නගින්න. ඉක්මන් කරන්න."

"බලන්න, අර කොනේ තව එක්කෙනෙකුට වාඩි වෙන්න පුළුවන්. අර නිල් පාට සාරිය ඇඳගෙන ඉන්න අම්මා එතනින් වාඩිවෙන්න."

"ඕගොල්ලො එහාට වෙලා ඉඩ දෙන්න."

"හිටගෙන ඉන්න අය පේළි දෙකට පස්සට යන්න. මැදින් ඉඩ දෙන්න. අනික් අය පස්සට යන්න."

" පස්සට යන්න බැරි අය පැත්තකට වෙලා ඉඩ දෙන්න."

"වාද්දුවට ගන්නව ද?"

"වාද්දුව හන්දියෙන් තමයි බහින්න වෙන්නෙ."

"කමක් නෑ නගින්නම්."

" ඔය ළඟින් බහින එක්කෙනා ඉස්සරහට එන්න."

" මේ පාර්සලේ කාගෙ ද? පාර්සල් තමන් ළඟින් තියාගන්න."

" ළඟින් බහින කවුරු හරි මේ සීයාට වාඩිවෙන්න ඉඩ දෙන්න"

## ක්‍රියාකාරකම : 1

කණ්ඩායම් වශයෙන් එක් වී සිත් ගත් කොටසක් සංවාදයක් ලෙස පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 2

තද කළු අකුරින් මුද්‍රිත පද වෙනුවට වෙනත් පද යොදා සංවාද ගොඩ නගා පන්තියට ඉදිරිපත් කරන්න.

වසන්ත : මුදලාලි මේ **පෑනක්** කීය ද?
මුදලාලි : රුපියල් **පහළොවයි.**
වසන්ත : රුපියල් **පහළොවට** වඩා අඩු කරන්න බැරි ද?
මුදලාලි : හොඳයි, රුපියල් **දහතුනක්** දෙන්න.

## ක්‍රියාකාරකම : 3

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

i. බස්රිය නවත්වන තැන් පහක් කියන්න.
ii. ලොකු පාර්සල් අරගෙන නගින්න එපා යැයි කීවේ ඇයි?
iii. වාඩිවෙන්න කිව්වේ කාට ද?
iv. පස්සට යන්න බැරි අයට කීවේ කුමක් ද?
v. ළඟින් බහින එක්කෙනා කළ යුත්තේ කුමක් ද?

## ක්‍රියාකාරකම : 4

කළු කර ඇති පද ගැන අවධානය යොමු කරමින් පහත සඳහන් වාක්‍ය කියන්න. කළු කර ඇති පද වෙනුවට වරහන් තුළ දී ඇති පද යොදා වාක්‍ය නැවත කියන්න.

i. අම්මා ඉක්මනට **එන්න** අන්න බස් එක එනවා.
(යන්න)

ii. අර කොනේ තව **එක්කෙනෙකුට** වාඩි වෙන්න පුළුවන්.
(දෙන්නෙකුට)

iii. **පානදුරෙන්** මෙහා නවත්තන්නෙ නැහැ.
(මොරටුවෙන්)

iv. බස් එකට නැගපු අය **පස්සට** යන්න
(ඉස්සරහට)

v. මට **නගින්න** ඉඩ දෙන්න.
(බහින්න)

## ක්‍රියාකාරකම : 5

- ✸ හතර දෙනා බැගින් එක් වී වෙළෙඳපොළක දී ඇති විය හැකි කතාබහ කෙටියෙන් සකස් කර ගන්න.
- ✸ එක් එක් කණ්ඩායම එම සංවාද පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 6

පහත වගුවේ දක්වා ඇති උදහරණය බලා වගුව සම්පූර්ණ කර කියන්න. ඒ ඇසුරෙන් වාක්‍ය තනන්න.

| | i | ii | iii | iv |
|---|---|---|---|---|
| අම්මා බසයට | නගිනවා | නගින්න | නගින්න එපා | නගින්න ද? |
| අම්මා පස්සට | යනවා | .......................... | .......................... | .......................... |
| අක්කාට ඉඩ | දෙනවා | .......................... | .......................... | .......................... |
| පාර්සලය බිම | තියෙනවා | .......................... | .......................... | .......................... |
| මල්ලී පානදුරෙන් | බහිනවා | .......................... | .......................... | .......................... |
| මාමා අසුනක | වාඩිවෙනවා | .......................... | .......................... | .......................... |